සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**62 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2014

| | | |
|---|---|---|
| **පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය** | **I, II** | **පැය තුනයි** |
| குடியுரிமைக் கல்வி மற்றும் சமூக நிர்வாகம் | **I, II** | மூன்று மணித்தியாலம் |
| Citizenship Education & Governance | **I, II** | *Three hours* |

**විභාග අංකය :..............................**

## (62) පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය I

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

● අංක **1** සිට **10** තෙක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා, **තිත් ඉර මත** ලියන්න.

1. රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ........................................................ නීතිය ලෙස හැඳින්වේ.
(සිවිල් / මූලික / පරිපාලන)

2. රාජ්‍යයක පාලන කටයුතු මෙහෙයවන ප්‍රධාන ආයතනය........................................................ වේ.
(පාර්ලිමේන්තුව / කැබිනට් මණ්ඩලය / ආණ්ඩුව)

3. ව්‍යවස්ථාදායක සභාව ........................................................ ලෙස ද හඳුන්වනු ලැබේ.
(කැබිනට් මණ්ඩලය / ආණ්ඩු පක්ෂය / පාර්ලිමේන්තුව)

4. එක් සංස්කෘතියක සමහර අංග ලක්ෂණ තවත් සංස්කෘතියක් තුළ ව්‍යාප්ත වීම ................................ නම් වේ.
(විසරණය / ගෝලීයකරණය / සංක්‍රමණය)

5. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රධාන නීති නිලධාරියා වන්නේ ........................................ ය.
(නීතිපතිතුමා / අග්‍ර විනිශ්චයකාරතුමා / කථානායකතුමා)

6. එකම පාලන ව්‍යුහයක් තුළ විවිධ භාෂා කථාකරන, විවිධ ආගම් අදහන, විවිධ සිරිත් විරිත් අනුගමනය කරන පිරිස් සිටින සමාජයක් ........................................................ සමාජයක් ලෙස හඳුන්වනු ලැබේ.
(බහු වාර්ගික / බහු සංස්කෘතික/ බහු ජාතීය)

7. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා මිනිසා විසින් යොදා ගනු ලබන නිෂ්පාදන ආධාරක ................................ නම් වේ.
(උපකරණ / මෙවලම් / ප්‍රාග්ධනය)

8. මධ්‍යම ආණ්ඩුවට හා පළාත් සභාවලට සමසේ භුක්ති විඳිය හැකි බලතල ........................................ ලැයිස්තුවෙහි දක්වා ඇත.
(විවෘත / සමගාමී / සංවෘත )

9. මහජනතාවට වඩාත් ඵලදායි හා කඩිනම් සේවාවක් සැපයීමේ අරමුණින් පළාත් පාලන ආයතනවලට ................ ................................ සංකල්පය හඳුන්වා දී ඇත.
(යහපාලන / කාර්යක්ෂමතා / සමානාත්මතා)

10. පරිසරයේ දක්නට ලැබෙන ශාක හා සතුන් ........................................................ ගණයට අයත් වේ.
(ජෛව සම්පත් / අජෛව සම්පත් / පරිසර සම්පත්)

[ දෙවැනි පිටුව බලන්න.

- අංක **11** සිට **20** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් හරි (✓) ලකුණ ද වැරදි නම් වැරදි (✗) ලකුණ ද ඉදිරියේ ඇති **වරහන තුළ** ලකුණු කරන්න.

11. 'තේසවලාමෙයි' නීතිය උඩරට වතුකරයේ ජනතාවට අදාළ වන නීතියකි. (.........)

12. ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවා ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනය මගිනි. (.........)

13. මානව දරිද්‍රතා දර්ශකය සකස් කිරීමේ නිර්ණායකයක් ලෙස 'ක්‍රය ශක්තිය' යොදා ගැනේ. (.........)

14. වැඩවර්ජනයක් හේතුවෙන් ජාතික ආර්ථිකයට හානිදායක බලපෑමක් සිදුවන අවස්ථාවක වෘත්තීය සමිති ක්‍රියාමාර්ග අත්හිටුවීමට නියෝග නිකුත් කිරීමේ බලය අධිකරණයට ඇත. (.........)

15. ජනමත විචාරණ ක්‍රමය ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලද්දේ 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව මගිනි. (.........)

16. සියලු ම ඉඩම් නඩු විභාග කිරීමේ බලය මහාධිකරණය සතු වේ. (.........)

17. නීතියේ මූලික අරමුණ ජනතාවට යුක්තිය ඉටු කිරීම ය. (.........)

18. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාදායකය ඒක මාණ්ඩලික වේ. (.........)

19. රාජ්‍යයන් අතර සාමකාමී සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා සාම සාධක හමුදා යොදා ගනී. (.........)

20. රජය විසින් පනවනු ලබන හා ක්‍රියාත්මක කරනු ලබන රෙගුලාසි, රීති හා සම්ප්‍රදායයන් නීතිය ලෙසින් හැඳින්වේ. (.........)

- අංක **21** සිට **30** තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට අදාළ පිළිතුර **තිත් ඉර මත** ලියන්න.

21. පුද්ගලයකු හෝ කණ්ඩායමක් විසින් සමාජයට කරනු ලබන වැරදි සම්බන්ධයෙන් බලපාන නීතිය හඳුන්වන්නේ කවර නමකින් ද?

.......................................................................................................................

22. 'ජෝන් ගැල්ටුංග්'ගේ ගැටුම් ත්‍රිකෝණයට අනුව ව්‍යුහය, ආකල්ප හා ........................................ යනුවෙන් ගැටුමක් ඇති විය හැකි අවස්ථා තුනක් දක්වා ඇත.

23. අයිතිවාසිකම්, සමානාත්මතාව හා........................................ ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම ලෙස සැලකේ.

24. රජයේ පරිපාලන බලතල පමණක් ප්‍රාදේශීය මට්ටමින් පවරාදීමේ ක්‍රියාවලිය හඳුන්වන නම කුමක් ද?

.......................................................................................................................

25. පළාත් සභාවක නාමික විධායකවරයා පත්කරනු ලබන්නේ කවුරුන් විසින් ද? ........................................

26. රජය සතු නිෂ්පාදන සම්පත් සමාජ සුබසාධනය උපරිම වන ආකාරයෙන් මෙහෙයවනු ලබන අර්ථ ක්‍රමය හඳුන්වනු ලබන්නේ කවර නමකින් ද? ........................................

27. මානව සංවර්ධන දර්ශකය අනුව පහළ සංවර්ධන මට්ටමේ සිටින රටවල් අතුරෙන් බහුතරයක් පිහිටා ඇත්තේ ........................................ මහාද්වීපයේ ය.

28. කාර්මික ආරවුල් පිළිබඳ පනතේ 15 (අ) වගන්තියේ සිට 21 වන වගන්තිය දක්වා වූ විධි විධාන අනුව කාර්මික ආරවුලක් සමථයකට පත්කිරීමේ ක්‍රියාවලිය ........................................ නම් වේ.

29. විදේශීය ශුද්ධ සාධක ආදායම ද සැලකිල්ලට ගැනීමෙන් පසුව රටක වර්ෂයක් තුළ නිපදවන සියලු ම භාණ්ඩ හා සේවාවල වටිනාකම්වල එකතුව හැඳින්වෙන්නේ කවර නමකින් ද?

.......................................................................................................................

30. දෙවන ලෝක යුද්ධයෙන් පසු බටහිර යුරෝපා රටවල් එක්ව සිය ආරක්ෂාව සඳහා පිහිටුවාගත් ප්‍රථම කලාපීය ආරක්ෂක සංවිධානය කුමක් ද? ........................................

[ තුන්වැනි පිටුව බලන්න.

● අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

31. රටක සියලු ම පුරවැසියන් එක්රැස් වී පාලන කටයුතු පිළිබඳ ව තීරණ ගැනීම,
   (1) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයයි.
   (2) ඍජු ප්‍රජාතන්ත්‍රවාදයයි.
   (3) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදයයි.
   (4) ව්‍යවස්ථානුගත ප්‍රජාතන්ත්‍රවාදයයි. (......)

32. "රටක විවිධ ජාතීන් ජීවත්වුව ද ඔවුන් එක් ජාතියක් ලෙස සැලකිය යුතු ය" යන අදහසින් බිහි වූ දේශපාලන සංකල්පය වන්නේ,
   (1) මානව වාදයයි. (2) ලිබරල් වාදයයි. (3) ගෝලීයකරණයයි. (4) ජාතික රාජ්‍යයයි. (......)

33. වෙළඳපොළ ආර්ථිකයක ප්‍රධාන ලක්ෂණය වන්නේ,
   (1) නිෂ්පාදන ක්‍රියාවලියෙහි දී සෘණ බාහිරතා කෙරෙහි සැලකිලිමත් වීම ය.
   (2) වෙළෙඳපොළ කටයුතුවලට රාජ්‍ය මැදිහත් වීම ය.
   (3) ආර්ථික ප්‍රශ්න විසඳීමේ දී ඉල්ලුම් හා සැපයුම් බලවේග මත ලැබෙන මිල අනුව තීරණ ගැනීම ය.
   (4) ජනතාවගේ සුබසාධනය උදෙසා භාණ්ඩ නිෂ්පාදනයට ප්‍රමුඛත්වය දීම ය. (......)

34. පසුගිය වසර කිහිපය තුළ ලෝක ආර්ථිකයේ, නිෂ්පාදන අංශයෙහි ඇති වූ ගෝලීයකරණයේ කැපීපෙනෙන ප්‍රවණතාවක් වූයේ,
   (1) රටවල් අතර වෙළෙඳ ගිවිසුම් හා කලාපීය සංවිධාන බිහිවීමයි.
   (2) නිෂ්පාදන පිරිවැය බෙහෙවින් ඉහළ නැගීමයි.
   (3) යුරෝපයේ බොහෝ රටවල ද, ඇමෙරිකා එක්සත් ජනපදය හා ජපානය වැනි රටවල ද බහුජාතික සමාගම්වල වර්ධනයයි.
   (4) බොහෝ රටවල් ජාත්‍යන්තර වෙළෙඳාමේ දී පොදු මුදල් ඒකක භාවිතයට යොමු වීමයි. (......)

35. ගැටුම් නිරාකරණය සඳහා පුද්ගලයකු තුළ තිබිය යුතු මූලික කුසලතා වන්නේ,
   (1) ගැටුම් විශ්ලේෂණය, විකල්ප ජනනය, සහමන්ත්‍රණය සහ සමථකරණයයි.
   (2) ගැටුම් විශ්ලේෂණය, සවන්දීම, සමථකරණය සහ සහමන්ත්‍රණයයි.
   (3) ගැටුම් විශ්ලේෂණය, විකල්ප ජනනය, සහමන්ත්‍රණය සහ යටත්වීමයි.
   (4) ගැටුම් විශ්ලේෂණය, සවන්දීම, සහමන්ත්‍රණය සහ නිහතමානී බවයි. (......)

36. ශ්‍රී ලංකාව මැතිවරණ කොට්ඨාසවලට බෙදා වෙන් කිරීමේ දී සැලකිල්ලට ගනු ලබන ප්‍රධාන නිර්ණායක ඇතුළත් පිළිතුර කුමක් ද?
   (1) භූමිය, ඡන්ද සංඛ්‍යාව සහ ජන සංයුතිය
   (2) භූමිය, ජන ඝනත්වය සහ ජන සංයුතිය
   (3) ජන සංයුතිය, ජන ඝනත්වය සහ ජන අනුපාතය
   (4) භූමිය, ඡන්ද සංඛ්‍යාව සහ ජන ඝනත්වය (......)

37. රටක නීතියක් ක්‍රියාත්මක වීම ආරම්භ වන්නේ,
   (1) පාර්ලිමේන්තුවේ දී පනත් කෙටුම්පතක් සම්මත වීමෙන් පසුව ය.
   (2) පාර්ලිමේන්තුවෙන් සම්මත වූ පනත් කෙටුම්පතකට ජනාධිපතිවරයා අත්සන් තැබීමෙන් පසුව ය.
   (3) පාර්ලිමේන්තුවෙන් සම්මත වූ පනත් කෙටුම්පතකට කථානායකවරයා අත්සන යෙදීමෙන් පසුව ය.
   (4) පනත් කෙටුම්පතට ශ්‍රේෂ්ඨාධිකරණයේ අනුමැතිය ලැබීමෙන් පසුව ය. (......)

38. පාරිසරික ගැටලු ඇතිවීම කෙරෙහි බලපාන මූලික හේතුව ලෙස සැලකිය හැක්කේ මින් කවරක් ද?
   (1) පරිසරයට අපද්‍රව්‍ය මුදා හැරීම
   (2) පරිසරය පිළිබඳ ජනතාව තුළ යහපත් ආකල්ප නොමැති වීම
   (3) පරිසර සම්පත් අසීමිතව පරිභෝජනය කිරීම
   (4) පරිසර නීති ප්‍රමාණවත් නොවීම (......)

39. සාක්ෂරතාව, උපතේ දී අපේක්ෂිත ආයු කාලය හා ක්‍රය ශක්තිය පදනම් කරගෙන ගණනය කරනු ලබන දර්ශකය කුමක් ද?
   (1) මානව දරිද්‍රතා දර්ශකය
   (2) මානව පීඩක දර්ශකය
   (3) භෞතික ජීවන තත්ත්ව දර්ශකය
   (4) මානව සංවර්ධන දර්ශකය (......)

40. මානව හිමිකම් කඩවීමක් සම්බන්ධව ශ්‍රී ලාංකිකයකුට පැමිණිලි කළ හැකි ඉහළ ම ජාත්‍යන්තර ආයතනය මින් කවරක් ද?
   (1) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම
   (2) ජාත්‍යන්තර අධිකරණය
   (3) ජාත්‍යන්තර කම්කරු සංවිධානය
   (4) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය (......)

* *

[ හතරවැනි පිටුව බලන්න.

මෙතැනින් කපන්න

The National e-Learning Portal for the General Education

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**62 S I, II**

111740

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2014**

**පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය I, II**
குடியுரிமைக் கல்வி மற்றும் சமூக நிர்வாகம் I, II
Citizenship Education & Governance I, II

## (62) පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය II

* **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** (i) සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමාන රාජ්‍යයන් තුළ ක්‍රියාත්මක නොවීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.
(ii) 'වෙනස්කම් තුළින් එකමුතු බව' තේමාව කරගෙන සංවර්ධිත තත්ත්වයට පත් වූ රටවල් **දෙකක්** නම් කරන්න.
(iii) ජාතික රාජ්‍යයන් බිහිවීමට හේතු වූ සුවිශේෂී සාධක **දෙකක්** ලියා දක්වන්න.
(iv) සන්ධීය ආණ්ඩුක්‍රමයක ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
(v) ඕනෑම ආර්ථිකයක් තුළ සිදුවන ප්‍රධාන ක්‍රියාවලි තුනකි. ඉන් **දෙකක්** නම් කරන්න.
(vi) ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය සතු බලතල හා කාර්යයන්ගෙන් **දෙකක්** සඳහන් කරන්න.
(vii) ආණ්ඩුවක ප්‍රධාන කොටස් **දෙකක්** නම් කරන්න.
(viii) අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා සිදු කළ ඓතිහාසික විප්ලව **දෙකක්** නම් කරන්න.
(ix) ශ්‍රී ලංකාව හැර 'සාර්ක්' සංවිධානයට අයත් රටවල් **දෙකක්** නම් කරන්න.
(x) ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වාගෙන යනු ලබන ප්‍රධාන අංශ **දෙක** මොනවා ද? (ලකුණු 02 × 10 = 20 යි)

**2.** ජනතාව විසින් ජනතාව උදෙසා ගෙන යනු ලබන ජනතාවගේ පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයයි.
(i) අතීතයේ ශ්‍රී ලංකාවේ පැවති රාජ්‍ය පාලන ක්‍රමවල ප්‍රජාතන්ත්‍රවාදී අංග ලක්ෂණ පැවති බවට **නිදසුන් දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)
(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක දක්නට ලැබෙන ප්‍රධාන අංග **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
(iii) (a) ආණ්ඩුක්‍රමවල ස්වරූප **දෙකක්** නම් කරන්න.
(b) ඔබ නම් කළ එක් ආණ්ඩුක්‍රමයක ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 05 යි)

**3.** මෙලොව උපත ලබන සෑම පුද්ගලයකුට ම සමාන අයිතිවාසිකම් ලබා ගැනීමට හිමිකමක් ඇත.
(i) (a) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් යටතට ගැනෙන එක් අයිතිවාසිකමක් ද,
(b) ආර්ථික හා සමාජයීය අයිතිවාසිකම් යටතට ගැනෙන එක් අයිතිවාසිකමක් ද,
නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) ළමා අයිතිවාසිකම් සම්මුතිය සකස් කිරීමේ දී විශේෂ අවධානය යොමු කළ අංශ **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු ලෙස ඔබ විසින් ඉටු කළ යුතු සදාචාරාත්මක යුතුකම් **තුනක්** නම් කොට, ඉන් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**4.** රටක සංවර්ධන ක්‍රියාදාමය පසුගාමීත්වයට පත් කිරීමට බලපාන ප්‍රධාන සාධකයකි, ගැටුම්.
(i) ගැටුම් ඇතිවීමට බලපාන මූල **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
(ii) ගැටුමක් නිරාකරණය කිරීම සඳහා මැදිහත්කරුවකු විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(iii) ගැටුම් නිසා රටක සංවර්ධන ක්‍රියාවලියට හානි සිදුවන ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

[ පස්වැනි පිටුව බලන්න.

**5.** විවිධාකාර වූ ජෛව සම්පත්වලට ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව සිදුවන විනාශය ජෛව සම්පත් හායනයයි.

(i) ජෛව සම්පත් හායනය සිදුවන අවස්ථා **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) වායු දූෂණය සිදුවන ක්‍රම **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) යහපත් පරිසරයක් පවත්වාගෙන යාම සඳහා පුරවැසියකු වශයෙන් ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**6.** ජාතීන් අතර පවත්නා සියලු ම ආකාරයේ සම්බන්ධතා ජාත්‍යන්තර සම්බන්ධතා ලෙස හැඳින්වේ.

(i) ජාත්‍යන්තර සම්බන්ධතා සඳහා පාදක වන සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) බලවත් රාජ්‍යයන් දුබල රාජ්‍යයන් වෙත බලපෑම් කරන අංශ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ලෝකයේ බලවත් රටවලින් ශ්‍රී ලංකාවට ඇති කරන යහපත් බලපෑමක් හා අයහපත් බලපෑමක් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**7.** තාක්ෂණික දියුණුව මිනිස් කටයුතු පහසුවෙන් කර ගැනීමට මහෝපකාරී වී ඇති අතර සමාජයේ යහපැවැත්මට බාධාකාරී වන අවස්ථා ද දක්නට ඇත.

(i) වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ තාක්ෂණය බහුලව යොදාගෙන ඇති ක්ෂේත්‍ර **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඔබ නම් කළ එක් ක්ෂේත්‍රයක තාක්ෂණය යොදා ගැනීම නිසා මිනිස් කටයුතු පහසු වී ඇති ආකාරය නිදසුන් **දෙකක්** දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

(iii) තාක්ෂණය අනිසි ලෙස යොදා ගැනීම සමාජයේ යහපැවැත්මට අහිතකර ලෙස බලපාන ආකාරය නිදසුන් **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

***

The National e-learning Portal for The General Education